# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 27 දරන
# බදුල්ල සුහසාධක සංගමය
# (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජූනි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

**මිළ : ශත 60 යි** **තැපැල් ගාස්තුව ශත : 60 යි**

# 1984 අංක 27 දරන බදුල්ල සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 21 වන දින.]

එල්. ඩී.—ඕ. 69/81.

**බදුල්ල සුභසාධක සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"බදුල්ල සුභසාධක සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් බදුල්ලේ පිහිටුවා තිබූ හෙයින් ද :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස කර ගෙන ගොස් හා ක්‍රියාත්මක කර ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1984 අංක 27 දරන බදුල්ල සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. මේ පනත ආරම්භවීමේ දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) බදුල්ල සුභසාධක සංගමයේ දැනට සාමාජිකයන් ව සිටින හා සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් ද "බදුල්ල සුභසාධක සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව එකී නාමයෙන් සංස්ථාව විසින් ද සංස්ථාවට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. බදුල්ල සුභසාධක සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බදුල්ලේ උප දිසාපති කොට්ඨාසයෙහි පදිංචිකරුවන්ගේ සමාජයීය, ආර්ථික හා අධ්‍යාත්මික සුභසාධනය ඇති කිරීම ;

(ආ) කොට්ඨාසයෙහි සෞඛ්‍ය, අධ්‍යාපන හා සමාජ සේවා පවත්වා ගෙන යාම හා වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් රජයට හා ස්වේච්ඡා සංවිධානවලට සහාය දීම ;

(ඇ) කොට්ඨාසයෙහි ක්‍රීඩා කටයුතු නංවාලීම ;

(ඈ) කොට්ඨාසයෙහි රක්ෂා විරහිත පදිංචිකරුවන් ස්වයං රැකියා වල යෙදීම දියුණු කිරීම ;

(ඉ) කොට්ඨාසයෙහි පදිංචිකරුවන් තුළ මිත්‍රත්වය, අන්‍යොන්‍ය සහයෝගය හා යහපත් පුරවැසිභාවය දියුණු කිරීම ; සහ

(ඊ) ඉහත දැක්වුණු අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට අවශ්‍ය වූ ද, යෝග්‍ය වූ ද වෙනත් සියලු පියවර ගැනීම.

විධායක කාරක සභාව.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත විධායක කාරක සභාවක් විසින් සංස්ථාවේ රීතිවලට යටත්ව, පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වීමේ දිනයේ දී ධුර දරන සංගමයේ විධායක කාරක සභාව සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව විය යුතු ය.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද ; විධායක කාරක සභාවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කර ගෙන යාම සඳහා ද ; කටයුතු කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා අන්‍යාකාරයකින් ද සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී වැඩි ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල මේ පනතට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල විය යුතු ය. එවැනි රීති සාදනු ලැබූ විට එවැනිම රැස්වීමක දී, (2) වන උප වගන්තියේ නියමයන්ට යටත් ව, ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ කිසිම රීතියක් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර, නොකරනු ලැබිය යුතු ය.

(3) සංස්ථාවේ සියලුම සාමාජිකයන් තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු ණය හා සංගමයට අය විය යුතු ණය.

6. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ආරම්භ වීමේ දිනයේ දී පැවැති සංගමයේ සියලු ණය හා බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සංගමයට අයවිය යුතු සියලු ණය හා සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

7. විධායක කාරක සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. සංස්ථාවට, සංස්ථාවේ රීති වලට යටත්ව— සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලැබිය හැකි චංචල හෝ නිශ්චල හෝ යම් දේපළක් ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව තිබිය යුතු අතර, ඒ සියලු දේපළ සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා දරනු ලැබීමට ද ;

(ආ) ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට ද

නීතිය අනුව හැකියාව තිබිය යුතු ය.

9. සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් මුදල් ලබා ගැනීම සහ ඒ කාර්යය සඳහා යම් උකස්, බැඳුම්කර හෝ බැඳීම් සංස්ථාව විසින් ඇති කිරීම, ලියා අත්සන් කිරීම, ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය : ණය ගැනීමේ බලතල.

එසේ වුව ද, සංස්ථාව විසින් එසේ ලබා ගත හැකි මුදල්වල එකතුව, විධායක කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන මුදල නොඉක්මවිය යුතු ය.

10. සංස්ථාව වෙනුවෙන් හා එහි ප්‍රයෝජනය සඳහා සංස්ථාවේ යම් සාමාජිකයකු, නිලධරයකු, අනුයෝජිතයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද ගෙවීම්වල ප්‍රමාණයට, ඒ සාමාජිකයාට, නිලධරයාට, අනුයෝජිතයාට හෝ සේවකයාට සංස්ථාව විසින් ඒ මුදල ආපසු ගෙවනු ලැබිය හැකි ය. ආපසු ගෙවීම.

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.